www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – First Term Test – April 2019
පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 9 ශ්‍රේණිය

කාලය : පැය 2
Time :2hour

## Christianity – I
ක්‍රිස්තියානි ධර්මය– I

Name :- ................................................... Grade : -................ Index number:-....................

❖ **සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**

- **නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**

1. ස්වාමින්වහන්සේගේ අභිෂේක ලත් තැනැත්තා වශයෙන් හැඳින්වූයේ,
   (1) දාවිත් ය (2) ජොනතන් ය
   (3) සාවුල් ය (4) මෙෆිබොෂෙත් ය

2. දේව දරුවෙකු තුළ නොතිබිය යුතු ගුණාංගයකි,
   (1) නිහතමානීකම (2) අකීකරුකම
   (3) දේව විශ්වාසය (4) නිවැරදි දේ අගය කිරීම

3. යාච්ඤා කිරීමේ නිවැරදි ක්‍රමය ලෙස ජේසුස් වහන්සේ පෙන්වා දුන්නේ,
   (1) මිනිසුන්ට පෙනෙන පිණිස යාච්ඤා කිරීම ය
   (2) දිගින් දිගට හිස්වචන දෙඩීම ය
   (3) වැරදි කරන අයට දඬුවම් ලබා දෙන ලෙස ඉල්ලීම ය
   (4) ඇතුළු කාමරයට වැද දොර වසාගෙන යාච්ඤා කිරීම ය

4. අපගේ ජීවිත ගැටළුවලදී අප කළ යුත්තේ,
   (1) ඒවා ගැන කරදර වීමයි
   (2) අවිශ්වාසයෙන් කල් ගෙවීමයි
   (3) ඒවා ජේසුස් වහන්සේ වෙතට යොමු කිරීමයි
   (4) මනස අවුල් කර ගැනීමයි

5. ජේසුස් වහන්සේගේ මහත් බලය අත්දැකීමට අප තුළ නොතිබිය යුතු ගුණාංගයකි,
   (1) ඇදහිල්ල (2) දේව අණට කීකරු වීම
   (3) අවිශ්වාසය (4) දෙවිඳුන් පාමුල වැඳ වැටීම



agaram.lk
Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

6. සමාජ අවශ්‍යතාවයන් ඇති අය ගැන සැලකිලිමත්වීමේදී අප නොකල යුත්තේ,
   (1) අයහපත් ප්‍රතිචාර නිසා පසුබට වීම ය   (2) විශ්වාසය හා ඇදහිල්ල ඇතිකර ගැනීම ය
   (3) කීකරුකම වැඩි දියුණු කර ගැනීම ය   (4) දයානුකම්පාව දක්වීම ය

7. දෙවියන් වහන්සේ සමඟ සුහදතාවයෙන් ජීවත් වීම සඳහා අප සතු නොවිය යුතු ගුණාංගයකි,
   (1) නිවැරදි දේ අගය කිරීම
   (2) ගරු කටයුතු ලෙස හැසිරීම
   (3) අන් අය සමඟ අයහපත් සබඳතා පැවැත්වීම
   (4) දේව කැමැත්ත තේරුම් ගෙන ඉටු කිරීම

8. ජේසුස් වහන්සේ දේව පුත්‍රයා බවට හඳුනාගෙන සිටි කෙනෙකි,
   (1) සංවිධායකයා   (2) මරියතුමිය
   (3) සේවකයා   (4) අමුත්තා

9. දාවිත්ගේ ජීවිත පැවැත්ම තුල නොතිබූ ගුණාංගයකි,
   (1) දේව භය ඇතිව ජීවත් වීම   (2) යටහත්පහත්කම
   (3) සතුරාට වෛර කිරීම   (4) දැහැමි ජීවිතය

10. 'අපගේ පියාණෙනි, '' යන ආමන්ත්‍රණය,
   (1) ජුදෙව් දරුවන්ට ඉතා හුරු පුරුදු ඇමතුමයි
   (2) දෙවියන් වහන්සේව ගෞරවයෙන් පැසසීමයි
   (3) දේව පියාට කථා කරන විදිහයි
   (4) දේව පියාට ප්‍රේමය දක්වන විදිහයි

11. කිතුනුවකුගේ සෑම යැදුමකම හරය විය යුත්තේ,
   (1) අපගේ දවස්පතා භෝජනය ඉල්ලීම
   (2) නපුරාගෙන් මුදවා දෙන ලෙස ඉල්ලීම
   (3) දේව කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහි ද ඉටු වන ලෙස ඉල්ලීම ය
   (4) අපගේ වරදට කමාව ඉල්ලීම ය

12. භාරදහසකට කෑම ලබා දී ඉතිරි වූ කුඩ ගණන,
   (1) දොළහකි   (2) හතකි   (3) දහයකි   (4) අටකි

13. ජේසුස් වහන්සේ මෙලොවට වැඩියේ අපට,
   (1) දේව රාජ්‍ය උරුම කර දීමට ය
   (2) විවිධ සැප සම්පත් ලබා දීම ය
   (3) සියලු දෙයින් අපව පෝෂණය කිරීමට ය
   (4) අපට නිසි මඟ පෙන්වීමට ය



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

14. යාච්ඤා කිරීමේ දී අප අනුගමනය කළ යුතු දෙයක් නොවන්නේ,
    (1) දණ නැමීම ය (2) දෑස් පියා ගැනීම ය
    (3) දෑත් එක්ව තබා ගැනීම ය (4) සිතුවිලි වෙනතකට යොමු කිරීම ය

15. පරම්පරාවේ නිදොස් මිනිසා ලෙස හඳුන්වනු ලැබුවේ,
    (1) සාවුල් ය (2) පාවුල් ය
    (3) නෝවා ය (4) ස්තෙපන් ය

16. කිතුනු අප ධර්මිෂ්ඨව ක්‍රියා කල යුත්තේ,
    (1) අන් අයගේ ජීවිත විනාශ කිරීමෙනි
    (2) අපට විරුද්ධව ක්‍රියා කරන්නන්ගෙන් පලිගැනීමෙනි
    (3) කරුණාව දක්වීමේ හදවතකිනි
    (4) කමාව ලබා නොදීමෙනි

17. ජේසුස් වහන්සේ ගේ ප්‍රථම ප්‍රාතිහාර්යය ලෙස දක්වෙන්නේ,
    (1) අංශභාග රෝගියා සුව කිරීම ය
    (2) අන්ධයාට පෙනීම ලබා දීම ය
    (3) වතුර මිදි යුෂ කිරීම ය
    (4) යක්ෂ ආත්මක දුරු කිරීම ය

18. මිනිසාගේ අධ්‍යාත්මික පෝෂණය මෙන්ම ශාරීරික පෝෂණය ගැන ද ජේසුස් වහන්සේ අවධාරණයෙන් සිටි බව ඔප්පු කරන්නේ,
    (1) කන්ද උඩ දේශනාවෙනි (2) ශ්‍රාවකයින් තෝරා ගැනීමෙනි
    (3) භාරදහසකට කන්න දීමේ සිද්ධියෙනි (4) පරීක්ෂාවලින් ජය ගැනීමෙනි

19. "මිනිසා සබත උදෙසා නොව සබත මිනිසා උදෙසා " යන පිළිවෙත ජේසුස් වහන්සේ අනුගමනය කළ අවස්ථාවකි.
    (1) වලක වැටුනු බැටළුවා ගොඩ ගැනීම
    (2) ගෝලයන් කමතේ වී කරල් කඩාගෙන කෑම
    (3) අතක් පණ නැති මිනිසා සුවපත් කිරීම
    (4) අන්ධයාට සුවය දීම

20. අපගේ වේදනා හා රෝගාතුර අවස්ථාවලදී අප ක්‍රියා කල යුත්තේ,
    (1) කෙඳිරි ගාමින් හා සුසුම් හෙලමිනි
    (2) අඬමින් හා වැලපෙමිනි
    (3) විශ්වාසයෙන් හා ඇදහිල්ලෙන් ආයාචනය කරමිනි
    (4) දෙස් දෙවොල් තැබීමෙනි

(ල.2 x 20 =40)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

**Royal College - Colombo 07**
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 9 – First Term Test – April 2019
පළමු වාර පරීක්ෂණය - 2019 අප්‍රේල් - 9 ශ්‍රේණිය

## Christianity – II
## ක්‍රිස්තියානි ධර්මය– II

Name :- ..................................................... Grade : -................ Index number:-....................

❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4කට පිළිතුරු සපයන්න.**

1. (i) ජුදා ජන ජීවිතයේ අතිශයින්ම වැදගත් දිනය ලෙස හඳුන්වන්නේ කුමන දිනය ද?
   (ii) ''සබත් දිනයේ කල යුත්තේ යහපත ද අයහපත ද '' මෙම වදන් පැවසුවේ කවුරුන් විසින් කා හට ද?
   (iii) ගලීළයට අයත් ගමක් නම් කරන්න.
   (iv) රාජ්‍ය නිලධාරියාගේ පුත්‍රයා රෝගීව වාසය කළේ කෙසේ ද?
   (v) ස්වාමීන් වහන්සේ ................................................ අඟ හිඟ මට............................................... හිස්තැනට සුදුසු වචන ලියන්න.
   (vi) එලියා දිවැසිවරයා පෝෂණය ලැබූ අවස්ථා 2ක් ලියන්න.
   (vii) මරියතුමිය සහභාගී වූ මංගල්‍යය කුමක් ද?
   (viii) ''අපගේ පියාණෙනි'' යන ආමන්ත්‍රණයෙන් අපට වැටහෙන්නේ කුමක් ද?
   (ix) අපගේ වරදට කමාව ලැබීමට නම් අප සපුරාලිය යුතු කොන්දේසිය කුමක් ද?
   (x) සටනේදී මරණයට පත්වූ දෙදෙනා කවුද? (2x10=20)

2. ඇදහිල්ලෙන් සුවය
   (i) ජේසුස් වහන්සේ කානා නුවරදී කල දෙවන හාස්කම කුමක් ද? (ල.02)
   (ii) රාජ්‍ය නිලධාරියා තුලින් විදහා පෑ චරිත ලක්ෂණ 3ක් ලියන්න. (ල.03)
   (iii) කිතුනු අප රෝග හා පීඩාවලට මුහුණ දීමේදී ක්‍රියා කල යුත්තේ කෙසේ ද? (ල.05)

3. දේවපියා අපගේ දිව්‍ය පෝෂකයාණෝ ය.
   (i) මේ බව සනාථ කරන පැරණි ගිවිසුමේ සඳහන් අවස්ථාවක් ලියන්න. (ල.02)
   (ii) නව ගිවිසුමේ සඳහන් වන ජනතාව පෝෂණය කිරීම සඳහා ජේසුස් වහන්සේ කල හාස්කමක් ඉතා කෙටියෙන් ලියන්න. (ල.03)
   (iii) ඔබගේ ජීවිතය ඔබ අත්දකින ලද හාස්කමක් ඉතා කෙටියෙන් ලියන්න. (ල.05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!



agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

4. යාච්ඥාව කිතුනු දිවියට වැදගත්කමක් ගෙන දෙයි.
   - (i) යාච්ඥා කිරීම සඳහා යොදා ගත හැකි වෙනත් සන්නිවේදන මාධ්‍ය දෙකක් නම් කරන්න. (ල.02)
   - (ii) යාච්ඤා කිරීම යනු කුමක්දැයි කෙටියෙන් පහදන්න. (ල.03)
   - (iii) යාච්ඤාව බෙදෙන කොටස් 5 නම් කරමින් කෙටියෙන් හඳුන්වන්න. (ල.05)

5. දෙවිඳුන් අභියස දැහැමිකම
   - (i) දේව සබඳතා සහිතව ජීවත් වූ දැහැමි මිනිසා කවුද? (ල.02)
   - (ii) නෝවා නිදහස් මිනිසකු වීමට බලපෑ හේතු 3ක් ලියන්න. (ල.03)
   - (iii) අප වෙසෙන සමාජය තුල නිදොස් මිනිසකු ලෙස ජීවත්වීමට කිතුනු අප ක්‍රියා කලයුත්තේ කෙසේ ද? (ල.05)

6. ''ඔබ මට වඩා දැහැමිය''
   - (i) මෙසේ පැවසුවේ කවුරුන් විසින් කා හට ද? (ල.02)
   - (ii) දාවිත් කෙරෙන් ධර්මිෂ්ඨකම ප්‍රකාශ වූ අවස්ථා 2කක් ලියන්න. (ල.03)
   - (iii) දාවිත් තුලින් දිස්වු ගුණාංග 5ක් ලියන්න. (ල.05)

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk